පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය - නොවැම්බර් - සතිය - 01

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

Weekly School Department of Education, Sabaragamuwa Province/

ක්‍රියාකාරකම : **කථක් නර්තනයේ තොරතුරු රැස් කරමු.**

පළමු පියවර : ඔබ ශ්‍රේණියෙ දී භරත නර්තන සම්ප්‍රදාය පිළිබඳව තොරතුරු එක් රැස්කලා මතක ඇති ඒවා නැවත මතකයට නගා ගන්න.

දෙවන පියවර : පහත සටහන කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශ, සංගීත භාණ්ඩ, සංගීත සම්ප්‍රදාය, නර්තන අංග, රංග වස්ත්‍රාභරණ,කථක් යන වචනාර්ථය විස්තර කරන්න, කථක් නර්තනයේ ආගමික පසුබිම හඳුන්වන්න, නර්තන ශෛලි හතර (සරානා) නම් කරන්න, ග්‍රන්ථ රචනා කළ රජු නම් කරන්න, ඊට අමතරව, ප්‍රවීන ශිල්පීන්, උගන්වන ආයතනය, මෝගල්වරුන්ගේ බලපෑම, කථක් නර්තනයේ සුවිශේෂතා ද එක කරගනිමින් කුඩා පොතක් සකස් කරන්න. රූප සටහන් හා ඡායාරූපද එයට ඇතුළත් කරන්න.

තුන්වන පියවර : අන්තර්ජාලයෙන් indian classical dance – kathak ලෙස ගොස් මේ පිළිබඳ වැඩි විස්තර ලබාගත හැක.

කථක් නර්තනය උතුරු ඉන්දියාවේ පාරම්පරික ව පැවත එන ශාස්ත්‍රිය නර්තන සම්ප්‍රදායයකි. කථාවක් කීම යන අරුත ඇති කථක් හෙවත් කථක යන සංස්කෘත නාමයෙන් මෙය ඇති වූ බව කියැවේ. නර්තනය මාධ්‍යය කරගෙන මුද්‍රා භාවිත කරමින් තාල, රිද්ම අනුව අංග, ප්‍රත්‍යංග, උපාංග උපයෝගී කරගන්මින් භාව ප්‍රකාශනය සහතිව හෝ රහතිව කථාවක් රඟ දැකිවීම කථක් නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන ලක්ෂණයකි. කථක් නර්තනයේ නෘත, නෘත්‍ය, නාට්‍ය යන අංග තුන ම දක්නට ලැබේ. කථක් නර්තනය මුල් කාලවල දී හින්දු සංස්කෘතික ලක්ෂණ අනුව ගොඩනැගුණ නමුත් මෝගල් අධිරාජයාගෙන් පසු ව මුස්ලිම් ආභාසය ලබමින් විවිධ විපර්යාසයන්ට ලක් විය. මේ අනුව ආගමික හා සමාජ සංස්කෘතික ලක්ෂණවලට අනුකූල ව නර්තන ගොඩ නැගෙන්නට ඇත. ස්ත්‍රී, පුරුෂ දෙවර්ගය ම කථක් නර්තන රඟ දැක්වූ අතර රාජ සභාවන් හි ද දක්නට ලැබුණු බව සඳහන් ය. ප්‍රචලිත ප්‍රදේශ - කථක් නර්තනය උත්තර භාරතීය නර්තන සම්ප්‍රදායයක් වන අතර මහා රාෂ්ට්‍රය, ගුජරාට්, රාජස්ථාන්, දිල්ලි, ලක්නව් ප්‍රදේශවල ප්‍රචලිත ව පවතී.

කථක් නර්තන සරානා (ගුරුකුල) - කථක් නර්තන ප්‍රධාන වශයෙන් සරානා හතරකි. මෙම සරානා එක් එක් ප්‍රදේශවල ප්‍රචලිත වූ අතර විවිධ පුද්ගලයන්ගේ දායකත්වය අනුව ගොඩ නැගුණි. 1. ලකන්ව් සරානා :- නවාබ් වජිඩ් අලීෂා 19 වැනි ශතවර්ෂයේ දී ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයි 2. ජායිපූර් සරානා :- ජායිපූර් ප්‍රදේශයේ ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි. 3. බෙනාරිස් සරානා :- බෙනාරිස් ප්‍රදේශයේ ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි. 4. රායිගර් සරානා :- රායිගර් ප්‍රදේශයේ ගොඩනැගූ නර්තන සම්ප්‍රදායයකි. සංගීත සම්ප්‍රදායය - උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රදායය කථක් නර්තනයේ සංගීත සම්ප්‍රදායය යි. රාග පදනම් කරගත් සංගීතය භාවිත කරන අතර වාදනය සඳහා තබ්ලාව, පක්වාජ්, සර්පිනාව, සිතාරය තාම්පුරාව, සාරංගිය හා බටනළාව භාවිතයට ගැනේ.

රංග වස්ත්‍රාභරණ - කථක් නර්තනය සඳහා භාවිතයට ගන්නා රංග වස්ත්‍ර හින්දු හා මුස්ලිම් සංස්කෘතිය අනුව සකස් වී ඇත. දැනට වඩාත් භාවිත වන්නේ රාජ්පුට් වංශවතුන්ගේ ඇඳුමට සමාන වූ රංගවස්ත්‍ර ය. අධ්‍යාපන ආයතන - දිල්ලි කථක් කේන්ද්‍රය,1964 හින්දුස්ථානි සංගීත ආයතනයක් ලෙස ආරම්භ කළ අතර වර්තමානයේ කථක් නර්තන සඳහා විශේෂ වූ ආයතනයකි. නර්තන, නාට්‍ය යන අංග මෙහි හැදෑරිය හැකි ය. අග්‍රගණ්‍යයේ කථක් නර්තන ශිල්පීන් රාශියක් මෙහි සේවය කර ඇත.භාත්ඛණ්ඩේ විශ්වවිද්‍යාලයය - 1926 සංගීත ආයතනයක් ලෙස ආරම්භ කළ මෙම ආයතනය කලාකරුවන් රාශියක් බිහි කර ඇත. වර්තමානයේ සංගීතයට අමතර ව කථක්, භරත නාට්‍යම් හා මනිපුරි නර්තන මෙහි හැදෑරිය හැකි ය. කථක් නර්තන අංග - භූමි වන්දනා, ආමද්, සලාම්, බෝල්, පරන්, චක්‍රධාර්, ගත් ,තත්කාර්කථක් නර්තන ප්‍රවර්ධනයට දායකවූ ශිල්පීහු - නවාබ් වලිජ් අලීසා, අච්චන් මහරාජ්,

බිර්ජු මහාරාජ් - අවාද් රටේ 5 වැනි රජු ලෙස කටයුතු කළ මොහු 1822 දී උපත ලැබී ය. නර්තනය,නාට්‍ය,සංගීතය හා කථා ප්‍රභන්ධයට දක්ෂතා දක්වා ඇත. මුල් කාල වකවනුවල දී ආගමික සිද්ධස්ථානවලට සීමා වූ කථක් නර්තනය රාජ සභාවන් හි රඟ දැක්වීමට කටයුතු කළේ ය. එමෙන් ම කථක් නර්තනය සම්බන්ධ ව ග්‍රන්ථ රචනා කර ඇත.බිර්ජු මහරාජ්ගේ පියා අච්චන් මහා රාජ් ය. පාද චලන මෙන් ම භාව ප්‍රකාශනය හා නෘත්ත ලක්ෂණ මැනැවින් දැක්වීමට හැකි දක්ෂ ශිල්පියෙකි. රාජ සභාවන්හි නර්තන දක්වා ප්‍රසංශා ලබා ඇත. සංගීත් භාත්ඛණ්ඩ ආයතනයේ හා කථක් කේන්ද්‍රයේ ගුරුවරයෙක් ලෙස සේවයකර ඇත් අතර කථක් නර්තන අංග රාශියක් නිර්මාණය කර ඇත. නෘත, නෘත්‍ය ගණයේ නර්තන දැක්වීමට පරිපූර්ණ කුසලතා හිමි කරගත් ඔහු සංගීත නිර්මාණය, සිනමා සඳහා අංග රචනය ආදියෙන් දායකත්වය දක්වා ඇත. එමෙන් ම රාජසම්මාන රාශියක් ලබා ඇත.

∗∗∗